www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වතු වෘත්තීය සමිති කම්කරුවන්ගේ වැටුපට වල කපයි

## Sri Lankan plantation unions undermine workers' pay

**එස්. අජන්තන් විසිනි**
**2009 අගෝස්තු 07**

ලෝක ආර්ථිකය බිඳ වැටීම මැද්දැවේ තේ, රබර් සහ පොල් වතුවල වැඩ කරන ලක්ෂ ගනනක් කම්කරුවන්ගේ ආදායම දරිද්‍ර මට්ටමේ තැබීම සඳහා වැටුප් සාකච්ඡාවේ දී වතු වෘත්තීය සමිති හාම්පුතුන් සමග සහයෝගයෙන් කටයුතු කරමින් සිටිති.

වෘත්තීය සමිති සහ ලංකා හාම්පුතුන්ගේ සංගමය අතර කලින් පැවැති වසර දෙකක ගිවිසුම මාර්තු මාසයේ අවසන් වූ අතර නව ගිවිසුමක් සඳහා සාකච්ඡා, පෙබරවාරි මාසයේ සිට ඇදෙමින් තිබේ. ප්‍රමාදය ගැන විමසූ විට වෘත්තීය සමිති නායකයන් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ප්‍රකාශ කලේ උඅව පලාත් සභා මැතිවරනය තුල ඔවුන් කාර්යබහුල බැවින් ගිවිසුමක් පිලිබඳ අවසන් නිගමනයකට ඒමට නොහැකි බවය.

බහුතරය දෙමල කථා කරන වතු කම්කරුවන් අතර කෝපය වැඩෙමින් තිබේ. ඔවුහු කම්කරු පන්තිය අතර සිටින වඩාත් පීඩිත කම්කරු කොටස ය. කුටුම්බ ආදායම සහ වියදම පිලිබඳ 2006-2007 සමීක්ෂනයකට අනුව වතු ජනයාගෙන් සියයට 32ක් දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත් වෙති. වෘත්තීය සමිති නායකයෝ 2006 දෙසැම්බර් මාසයේ දී සති දෙකක වර්ජනය අත් හිටුවීමට සහ කම්කරුවන්ගේ ඉල්ලීමට බෙහෙවින් අඩු වැටුප් වැඩිවීමක් ඔවුන් මත පැටවීමට හාම්පුතුන් සහ ජනාධිපති රාජපක්ෂගේ ආන්ඩුව සමග ඒකාබද්ධ වූහ.

එතැන් සිට දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) ට එරෙහි වාර්ගික යුද්ධය සඳහා ආන්ඩුවේ දැවැන්ත වියදමේ කොටසක් ලෙස ඉහල ගිය මිල නිසා වතු කම්කරුවන් තදින්ම බැට කා ඇත. ඔවුන්ගේ වෘත්තීය සමිතිවල විරුද්ධත්වය නොතකා ලක්ෂ ගනනක් වතු කම්කරුවෝ වැටුප් වැඩිවීමක් ඉල්ලා පසුගිය ජූලි මාසයේ වර්ජනයක නිරත වූහ.

2006 වැටුප් සාකච්ඡා පැවති කාලයේ දී වතු කම්කරුවන්ගේ සැලකිය යුතු වැටුප් වැඩිවීමකට ආන්ඩුව විරුද්ධ වූ අතර යුද ව්‍යායාමය පාවාදීම සම්බන්ධයෙන් කම්කරුවන්ගේ අරගලය හෙලා දුටුවේ ය. මැයි මාසයේ දී මිලිටරිය විසින් එල්ටීටීඊය පරාජය කරනු ලැබීමෙන් පසු ජාතිය ගොඩනැගීම සඳහා සොල්දාදුවන් මෙන් කම්රුවන් ද පරිත්‍යාග කල යුතු යයි අවධාරනය කරමින් රාජපක්ෂ නව ආර්ථික යුද්ධයක් ප්‍රකාශයට පත් කලේ ය. වෘත්තීය සමිති අනිවාර්යයෙන්ම 2006 කල දේ ම කරනු ඇත.

වැටුප් සාකච්ඡාවලට සම්බන්ධ විශාලතම වෘත්තීය සමිතිය වන්නේ දේශපාලන පක්ෂයක් ලෙස ක්‍රියාත්මක වන සහ රාජපක්ෂ පාලක සභාගයේ කොටස්කරුවෙකු වන ලංකා කම්කරු කොංග්‍රසයයි (සීඩබ්ලිව්සී). විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) ට සම්බන්ධ ලංකා ජාතික වතු කම්කරු සංගමය (ලංජාවකස) සහ ලංකා සමසමාජ පක්ෂය (ලසසප) සහ ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය (කොප) ඇතුලු ඊනියා වමේ පක්ෂවලට සම්බන්ධ වෘත්තීය සමිති සන්ධානයක් වන ඒකාබද්ධ වතු වෘත්තීය සමිති මධ්‍යස්ථානය සෙසු වෘත්තීය සමිති වෙති. ලසසප සහ කොප ද ආන්ඩුවේ කොටස්කරුවෝ ය.

මූලික වැටුප රුපියල් 200, අවිචල්‍ය වැටුප රුපියල් 20 සහ රුපියල් 70 පැමිනීමේ දීමනාව ඇතුලුව වතු කම්කරුවකුගේ වර්තමාන දෛනික වැටුප රුපියල් 290කි. පැමිනීමේ දීමනාව ගෙවනු ලබන්නේ වතු කොම්පැනි විසින් දෙනු ලබන වැඩ දින ගනනෙන් සියයට 75 පැමිනියහොත් පමනි.

වෘත්තීය සමිති ආරම්භයේ දී රුපියල් 750 ඒකාබද්ධ වැටුපක් යෝජනා කල බව සීඩබ්ලිව්සී නායක මුතු සිවලින්ගම් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ප්‍රකාශ කලේ ය. කෙසේ නමුත් හාම්පුතුන් විරුද්ධ වූ විට වෘත්තීය සමිති විසින් ඉල්ලීම රුපියල් 500ට කප්පාදු කලේය. ඉතිරි වසර දෙකක කාලය සඳහා සියයට 12 හෙවත් රුපියල් 24 වැටුප් වැඩි කිරීමක් ගැන පමනක් සලකා බැලිය හැකි බව කියමින් හාම්පුතුන් විසින් එය ද ප්‍රතික්ෂේප කර තිබේ.

කම්කරුවන්ගෙන් ඇතිවිය හැකි ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් කනස්සල්ලට පත් වූ සමිති නායකයෝ සෙනසුරාදා උඅව පලාත් සභා මැතිවරනය අවසන් වන තුරු තව දුර සාකච්ඡා කල් තැබූහ. සාකච්ඡා ක්‍රියාමාර්ගය මගින් දැනටමත් පැහැදිලි වී ඇති ආකාරයට වෘත්තීය සමිති නායකයන්ගේ ප්‍රාථමික සැලකිල්ල

ඔවුන්ගේ සාමාජිකයන්ගේ දැවෙන සමාජ අවශ්‍යතාවයන් ගැන නොව හාම්පුතුන්ගේ ලාභය කෙරෙහි ය.

පසුගිය වසරට සන්සන්දනාත්මකව මෙම වසරේ ජනවාරි සහ මැයි මාසය අතර තුර තේ සහ රබර්වල විදේශ ඉපයීම් පිලිවෙලින් සියයට 21 සහ 30 පහත වැටුනි. පසුගිය වසරට සන්සන්දනාත්මකව මෙම වසරේ පලමු කාර්තුවේ දී තේ නිෂ්පාදනය සියයට 40.9 පහත වැටුනේ ය. ගෝලීය ඉල්ලුම පහත වැටීම, වියලි කාලගුනය සහ මිල ඉහල යාම නිසා පොහොර භාවිතය සියයට 16 පහත වැටීම නිෂ්පාදනය අඩු වීමට බල පෑ ප්‍රධාන හේතු ය.

කෙන්යාව, ඉන්දියාව, චීනය සහ බංගලාදේශය වැනි රටවල කම්කරුවන් මත දැඩි කොන්දේසි පැටවීමට උත්සාහ කරන හාම්පුතුන් සහ ආන්ඩු ඇතුලුව වියදම් කප්පාදු කිරීමේ බියකරු යුද්ධයක් ලෝක තේ වෙලඳ පොල තුල සිදු වෙමින් තිබේ. කෙන්යාවේ ශ්‍රම පිරිවැය සියයට 43.5 වන අතර ලංකාවේ එය සියයට 60 බව වතු සමාගම් කියති.

දොට්ට දැමීම්වලට, ඉහල යන වැඩ ප්‍රමානයන් සහ ආදායම් පහත වැටීමට කම්කරුවෝ මුහුන දී සිටිති. මෙම වසර මුල දී සිය ගනනක් රැකියා විනාශ කරමින් බදුල්ල දිස්ත්‍රික්කයේ නමුනුකුල වතු සමාගමේ සහ නුවර එලිය දිස්ත්‍රික්කයේ මස්කෙලිය වතු සමාගමේ තේ කර්මාන්ත ශාලා හතක් වසා දැමුනි. තේ දලු කඩන්නන්ගේ දෛනික වැඩ ප්‍රමානය කිලෝ 12 සිට 17 දක්වා ඉහල දමා ඇති අතර වැඩ දින ගනන සතියකට දින 3 හෝ 4 දක්වා අඩු කර ඇත.

කවර හෝ වැටුප් වැඩි වීමකට සමාගම් විරුද්ධව සිටිති. ඉන්දියානු ටාටා තේ සමාගමට අනුබද්ධ සමාගමක් වන වටවල වතු සමාගමේ සභාපති ජී. සතාසිවම් සමාගමේ වාර්ෂික වාර්තාවේ දී කොටස් හිමියන්ට මෙසේ ප්‍රකාශ කලේ ය. "වැටුප් දිරි දීමනා දීම සම්බන්ධ සම්ප්‍රදායික ප්‍රවිෂ්ටය අතීතයේ දී අභිමත ප්‍රතිපල ලබා දුන්නේ නැත. වතු සමාගම් මූල්‍ය අර්බුදයකට මුහුන දී සිටින තතු තුල මෙම වසරේ සාකච්ඡා වඩා දැඩි වීමක් බලාපොරොත්තු විය යුතු ය."

වැටුප් සාකච්ඡාවල නිරතව සිටින වෘත්තීය සමිති හාම්පුතුන්ට සහයෝගය දීමේ මාවත් සොයමින් සිටිති. ලංකා වතු කම්කරු සංගමයේ නායක ඒ.ඕ. රාමයියා මෙසේ පැවසීය: "ක්‍රියාකාරිත්වය මත පදනම් වූ වැටුප් සහිත සාමූහික ගිවිසුමකට යාමට සුදුසු අවස්ථාව එලඹෙන තුරු අප බලා සිටිනවා." එහි තේරුම නිෂ්පාදනයට වැටුප් ගැට ගැසීම ය.

ඒකාබද්ධ වතු වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති සහ ලසසපයට සම්බන්ධ ලංකා වතු කම්කරු සංගමයේ ප්‍රධාන ලේකම් සුප්පයියා රාමනාදන් ප්‍රකාශ කලේ: පහත වැටෙන තේ මිල ගැන වෘත්තීය සමිති සැලකිල්ල යොමු කල යුතු අතර "තේ මිල ඉහල ගිය විට කම්කරුවන් සඳහා යමක් ලබා ගැනීමේ වඩා හොඳ ගනුදෙනුවකට යා යුතු" බව ය.

ජනතා විමුක්ති පෙරමුනට සම්බන්ධ සමස්ත ලංකා වතු කම්කරු සංගමය සහ සීඩබ්ලිව්සීයෙන් බිඳුන කන්ඩායමක් වන කඳුරට ජනතා පෙරමුන වැටුප් සාකච්ඡාවලට සම්බන්ධ වී නැත. සෙසු වෘත්තීය සමිතිවලට වඩා තමන් සටන්කාමී බව මවා පාන අතර ම පසුගිය දෙසැම්බරයේ දී ඔවුහු ද වැටුප් අලෙවියට දායක වූහ.

කඳුරට ජනතා පෙරමුනේ නායක පී. චන්ද්‍රසේකරන් තවමත් රාජපක්ෂගේ පාලක සභාගයේ ඇමතියෙක් වන අතර ඔහු එහි සියලුම පිලිවෙත්වලට සහයෝගය දී තිබේ. කෙසේ නමුත්, ආන්ඩුවෙන් දුරස්ථ බවක් මවා පෙන්වීම සඳහා කඳුරට ජනතා පෙරමුන ඌව මැතිවරනයේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් වෙන්ව තරග කරයි. වැටුප් සාකච්ඡාවලට සහභාගි නොවන නමුදු ආන්ඩුවට තර්ජනයක් විය හැකි උද්ඝෝෂනයකට යාමට කඳුරට ජනතා පෙරමුනට අදහසක් නැත.

සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ලේකම් සහ ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ද වන රාමලිංගම් චන්ද්‍රසේකරන් "දැඩි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක්" සඳහා කැඳවුම් කර ඇත. "අප හාම්පුතුන්ට කියා සිටින්නේ කම්කරුවන් රැවටීම නවතා සාමූහික ගිවිසුමට අනුව කම්කරුවන්ගේ වැටුප් වැඩි කල යුතුයි කියලා" ඔහු ජවිපෙ වෘත්තීය සමිති පුවත්පත වන රතු ලංකා පත්‍රයට ප්‍රකාශ කලේ ය. කෙසේ නමුත් ජවිපෙ තත්ත්වය නොසන්සුන් නොකරනු ඇත. එය පිලිගත්තොත් ආන්ඩුවට සහයෝගය දෙන බව ඇඟවුම් කරමින් ජවිපෙ "ජාතිය ගොඩනැගීමේ" තමන්ගේ ම මූලෝපායක් ඉදිරිපත් කර තිබේ.

කම්කරුවන්ගේ මූලික උවමනාකම් ආරක්ෂා කිරීම, සමාගම්වල සහ සංගත ප්‍රභූවේ ලාබ අවශ්‍යතාවලට ඉදිරියෙන් තබන සමාජවාදී මූලෝපායකට මෙම සියලුම වෘත්තීය සමිති විරුද්ධ වෙති. වතු කම්කරුවන්ගේ සැබෑ අරගලයක් සඳහා සෙසු කම්කරු කොටස් දෙසට සහ ගෝලීය ආර්ථික බිඳවැටීමෙන් තදින් බැට කන කෙන්යාවේ, චීනයේ ඉන්දියාවේ සහ සෑම තැනකම තේ සහ රබර් කම්කරුවන් ඇතුලු ජාත්‍යන්තර කම්කරුවන් දෙසට හැරීමක් ඉල්ලා සිටිනු ලබයි. රාජපක්ෂ ආන්ඩුවට එරෙහි දේශපාලන අරගලයක් මෙහෙයවීම සඳහා වෘත්තීය සමිති නිලධරයෙන් බිඳීමක් අවශ්‍ය වන අතර සමාජවාදී ක්‍රියාමාර්ගයක් ක්‍රියාවට දැමීම සඳහා කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ ආන්ඩුවකට සටන් කල යුතු ය.

© www.wsws.org